**වයඹ පළාත් සභාව - 2013**

වයඹ පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 පළාත් සභා අරමුදල**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**2.2.2 අනෙකුත් ගිණුම්**

(අ) ආදායම් ගිණුම්

පළාත් මූල්‍ය රීති අනුව ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බලය ලබාදී ඇති ගණන්දීමේ නිලධාරීන් විසින් තමාට අයත් ආදායම් ගිණුම් සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම් සංකේතයන්ට අදාල ගිණුම් 2014 සැප්තැම්බර් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) විසර්ජන ගිණුම් ඇතුලු අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2014 මාර්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුමේ නම | 2013 වර්ෂයට අදාල | | | ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | |
| (i). විසර්ජන ගිණුම් | 26 | 26 | - | - |
| (ii). පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 73 | 60 | 13 | 74 |
| (iii). පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 | - | - |
| (iv). වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 04 | 03 | - |
| (v). අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 14 | 13 | 01 | 14 |
| එකතුව | 121 | 104 | 17 | 88 |

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

වයඹ පළාත් සභාවට අයත් දෙපාර්තමේන්තු 07 ක එකතුව රු. 10,462,434 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණයෙන් හෙළිදරව් කර නොතිබූ අතර, දෙපාර්තමේන්තු 10 කට අදාල රු. 32,498,919 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව හා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වලට අදාලව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු. 17,741,506 ක වෙනසක්ද, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව යන ආයතනවල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම්වල භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු. 52,290,518 ක වෙනසක්ද පැවතුණි.

(ආ) සමාජ සුභසාධන අමාත්‍යාංශය හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර ඇති අත්තිකාරම් 'බී' ගිණුම්වල කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා දෙපාර්තමේන්තු පාලන ගිණුම් ශේෂය අතර එකතුව රු. 762,026 ක වෙනසක් පැවතුණි.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල 05 ක සීසී 10 ලේඛණ හා ගිණුම සමඟ ඉදිරිපත් කළ කේවල ණය ශේෂ ලැයිස්තුව අතර එකතුව රු. 5,609,529 ක වෙනසක් පැවතුණි.

(ඈ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් "බී" ගිණුමේ කලාප කාර්යාල 04 ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන් හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර රු. 1,763,014 ක වෙනසක් පැවතුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

කුලියාපිටිය සමූපකාර සහකාර කොමසාරිස් කාර්යාල බල ප්‍රදේශයේ සමූපකාර සමිතිවලින් අයවිය යුතු හිඟ අරමුදල් ශේෂවල කාල විශ්ලේෂණයක් පිළියෙළ කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සමූපකාර සමිති 67 ක් විසින් පිළියෙල කරන ලද අරමුදල් ශේෂ විග්‍රහයන් සහ ලෙජර් සටහන් අතර අවස්ථා 47 කදී එකතුව රු.4,490,619 ක වැඩිවීමක් හා අවස්ථා 20 කදී එකතුව රු.1,817,278 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

### 2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කින් හා පළාත් සභාවේ දෙපාර්තමේන්තු 03 කින් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් වශයෙන් රු. 1,003,972,178 ක් පළාත් සභාවට ලැබිය යුතුව තිබුණි.

(ආ) අග්‍රිම ගිණුම්

පළාත් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තු 04 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් භාණ්ඩාගාරයට නොපියවූ අග්‍රිම ශේෂවල එකතුව රු. 9,578,198 ක් වී තිබුණි. එම ශේෂ තුළ වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොකළ රු. 819,533 ක අග්‍රිම ශේෂයක්ද ඇතුලත්ව තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් අමාත්‍යාංශ 03 ක, දෙපාර්තමේන්තු 07 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. 12,581,983 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අයවීමට ඇති සේවක ණය

පළාත් අමාත්‍යාංශ 04 ක, දෙපාර්තමේන්තු 08 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක ස්ථාන මාරු වී ගිය, මියගිය හා සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතූන් මත නිරවුල් නොකළ වර්ෂ 03 ඉක්මවූ ණය ශේෂවල එකතුව රු. 46,775,721 ක් විය.

**2.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙරියමඩුව ග්‍රාම නිලධාරී වසමේ අක්කර 25 කට අදාල දිගු කාලීන බදු ලිපිගොනුව අස්ථානගත වීම නිසා ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් ආදායම් ලිපිගොනු 539 ක වාර්ෂික බදු ලේඛණ පවත්වා නොතිබුණි.

**2.2.8 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| (i). 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) වගන්තිය හා 1973 සමුපකාර සමිති රීති 43 (11) | කුලියාපිටිය හා හලාවත සහකාර සමුපකාර කොමසාරිස් කාර්යාලවලට අයත් සමුපකාර සමිති හා සමුපකාර බැංකු 1110 කින් බැර විය යුතු දායක මුදල් එකතුව රු. 48,205,766 ක් 2013 වර්ෂය අවසාන වන විටත් සමුපකාර අරමුදලට බැර කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii). 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත 3.5 වගන්තිය | පෞද්ගලික වෛද්‍යායතන ලියාපදිංචි කිරීමේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් එකතු කරනු ලබන ගාස්තුවලින් සියයට 50 ක් පළාත් සභාව වෙත ගෙවිය යුතු වුවත්, එසේ නොකර විශේෂ ගිණුමකට රු. 3,082,660 ක් බැර කර තිබුණි. |
| (ආ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| (i). ප.මූ.රී. 97.4 හා 116.2 | පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක පළාත් සභා හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). ප.මූ.රී. 117.1 හා 118 | පළාත් මූල්‍ය රීති විධිවිධානවලට අනුකූල නොවන ලෙස මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2013 වර්ෂයේ එකතු කල ආදායමෙන් වියදම් දැරීමෙන් පසු රුපියල් මිලියන 1.2 සිට 9.1 දක්වා පරාසයක් තුළ ඉතිරි මුදල් මාස කිහිපයක්ද, හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2012, 2013 වර්ෂවල අයකරගෙන තිබූ පළාත් සභා ආදායම් හා ගාස්තු රු. 253,899 ක්ද පළාත් භාණ්ඩාගාරයට නොයවා පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (iii). ප.මූ.රී. 476 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු කාර්යාලයේ හා ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ 2012, 2013 වර්ෂවලද, පුත්තලම දිස්ත්‍රික් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කර්යාලය, ග්‍රාමීය රෝහල් 02 ක සහ මධ්‍යම බෙහෙත් ශාලා 07 ක 2010 වර්ෂයේ සිටද, තවත් මූලික රෝහලක, දිස්ත්‍රික් රෝහලක, ග්‍රාමීය රෝහල් 03 ක හා මධ්‍යම බෙහෙත් ශාලා 14 ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 06 ක 2011 වර්ෂයේ සිටද, භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. පර්යන්ත ඒකකයක, ග්‍රාමීය රෝහල් 02 ක, මධ්‍යම බෙහෙත් ශාලා 10ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක හා පුත්තලම මැලේරියා ඒකකයේ සහ හෘද රෝග සායනයේ භාණ්ඩ සමීක්ෂණ මෙතෙක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | පළාත් සභා පාසල් 1180 න් පාසල් 804 ක 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර තිබූ අතර, එයින් පාසල් 244 ක වාර්තා විගණනයට යොමු කර නොතිබුණි.<br><br>පළාත් සභා පාසල් 1183 න් පාසල් 849 කද, ජාතික පාසල් 35 කද, කලාප කාර්යාල 08 කද, 2013 භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබුණද පළාත් සභා පාසල් 285 කද ජාතික පාසල් 24 කද, කලාප අධ්‍යාපන කාර්යාල 03 කද වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි. |

(ඇ) චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i). | 2008 ජුනි 26 දිනැති අංක 14/2008 හා 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා 2012 හා 2013 වර්ෂවලදී එකතුව රු. 188,264 ක ඉන්ධන දීමනා වැඩිපුර ලබාගෙන තිබුණි. |
| (ii). | 2011 අගෝස්තු 06 දිනැති වයඹ ප්‍රධාන ලේකම්ගේ අංක. වප්‍රලේ/4/2/1/පඅාවැ-2011 දරන චක්‍රලේඛයේ 12 වගන්තිය | චක්‍රලේඛ ප්‍රකාරව පළාත් අයෝජන ප්‍රතිපාදන වලින් සියයට 20 ක් ස්වයං රැකියා සංරචකයට වෙන් කළ යුතු වුවද, එම නියමයන්ට අනුකූල නොවන ලෙස 2012 වර්ෂයේදී රු.161,830 ක් ලෙස සියයට 6 ක්ද, 2013 වර්ෂයේදී රු.363,239 ක් ලෙස සියයට 12 ක්ද වෙන් කර තිබුණි. |
| (iii). | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් අදාල වන ව්‍යවස්ථාමය රාමුව තුල ක්‍රියාත්මක විය හැකි වන පරිදි ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව සමුපකාර අරමුදලේ ගිණුම් විගණනය සහ වාර්තාකරණය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

### 2.2.9 ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගනුදෙනු

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි ශරීර සුවතා ඒකකයට රු.599,740 ක් වටිනා භාණ්ඩ, උපකරණ වර්ග 10 ක් මිලදී ගෙන සවි කර තිබුණද, එම භාණ්ඩ විධිමත්ව භාරගෙන ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි. මෙහි මූල්‍ය හා පරිපාලන කටයුතු පුහුණුකරුගේ අභිමතය පරිදි සිදු කිරීමට ඉඩ හැර තිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2013 ඇස්තමේන්තුගත ආදායම | 2013 තථ්‍ය ආදායම | 2012 ඇස්තමේන්තුගත ආදායම | 2012 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 10.02, 10.03 | නිෂ්පාදනය හා වියදම මත බදු | 4,941.00 | 4,007.15 | 3,242.24 | 3,409.57 |
| 20.02 | බදු කුලී, පොලී, ලාභ හා ලාභාංශ | 203.00 | 233.29 | 197.90 | 187.55 |
| 20.03 | විකුණුම් හා ගාස්තු | 447.00 | 461.11 | 1,525.26 | 1,284.04 |
| 20.06 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම | 2.00 | 0.24 | 2.60 | 0.53 |
| | එකතුව | 5,593.00 | 4,701.79 | 4,968.00 | 4,881.69 |

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බදු ආදායම රු. 933,853,524 ක් හෙවත් සියයට 19 ක් රැස් කිරීමට අපොහොසත්ව තිබුණි. එමෙන්ම බදු නොවන ආදායම රු. 42,642,422 කින් වැඩිවී තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයන්ගෙන් අයවිය යුතු හිඟ බදු හා දඩ මුදල්වල එකතුව රු. 11,123,585 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන ආයතන 25 කට අදාලව ලැබී තිබූ උසාවි දඩ මුදල් රු.30,895,298 ක් සහ පළාත් පාලන ආයතන 03 කට අදාළව ලැබී තිබූ මුද්දර ගාස්තු රු. 60,974,947 ක් අදාල පළාත් පාලන ආයතනවලට යවා නොතිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.275,981,295 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.600,164,364 ක් විය.

## 4.2 ව්‍යුහාත්මක මූල්‍ය සමාලෝචනය

ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2013 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 4,941.00 | 4,007.15 | 933.85 | 4,322.24 | 4,205.87 | 116.37 |
| බදු නොවන ආදායම් | 652.00 | 694.64 | (42.64) | 645.76 | 675.83 | (30.07) |
| රජයේ ප්‍රදාන | 17,568.44 | 16,332.24 | 1,236.20 | 15,519.60 | 13,159.49 | 2,360.11 |
| එකතුව | 23,161.44 | 21,034.03 | 2,127.41 | 20,487.60 | 18,041.19 | 2,446.41 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 16,050.31 | 15,369.68 | 680.63 | 13,380.49 | 13,860.99 | (480.50) |
| අනෙකුත් වියදම් | 4,650.90 | 3,800.17 | 850.73 | 4,992.30 | 3,452.59 | 1,539.71 |
| උප එකතුව | 20,701.21 | 19,169.85 | 1,531.36 | 18,372.79 | 17,313.58 | 1,059.21 |
| **ප්‍රාග්ධන වියදම්** | 2,460.23 | 1,588.20 | 872.03 | 2,114.81 | 1,327.77 | 787.04 |
| එකතුව | 23,161.44 | 20,758.05 | 2,403.39 | 20,487.60 | 18,641.35 | 1,846.25 |

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුලු වියදමින් සියයට 92.35 ක් පුනරාවර්තන වියදම්ද, සියයට 7.65 ක් මූලධන වියදම්ද විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුලු ආදායමින් බදු ආදායම් සියයට 19.05 ක්ද, බදු නොවන ආදායම් සියයට 3.3 ක්ද, රජයේ ප්‍රදාන සියයට 77.65 ක්ද විය.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.748,452,671 ක් හා ඊට පෙර වර්ෂයේදී රු.1,152,378,365 ක් භාණ්ඩාගර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. මෙයට අමතරව සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ අරමුදල් 03 ක හා අධිකාරී 07 ක පැවති අරමුදල්වලින් රු. 362,714,680 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඈ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 09 කින් වැය විෂයයන් 26 කට සලසා තිබූ රු. 114,151,640 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ශීර්ෂ 20 කට අදාල වැය විෂයයන් 262 කට සලසා තිබූ රු. 2,377,708,356 ක ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයකින් ඉතිරි වීම් පැවතුණි.

## 05. අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

## 5.1 අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම්

### 5.1.1 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

වර්ෂ 2010 සිට 2013 දක්වා ආයතනය අලාභ ලැබීම නිසා එය ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑමෙන් හිමිකාරීත්වය හීන වී යාමක් නිරීක්ෂණය වූ අතර පළාත් සභාවේ/ රජයේ හෝ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව අධිකාරිය පවත්වාගෙන යෑම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(2) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වූවද, එය ප්‍රාග්ධන ගිණුම මගින් සිදු කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ගිණුම රු. 81,425,060 ක ඍණ අගයක් ගෙන තිබුණි.

(ii) සේවා කාලය වසර 05ක් ඉක්ම වූ සේවකයින් 86 දෙනෙකුට රු. 17,827,630 ක් පාරිතෝෂිත වෙන් කළ යුතු වූවද, රු. 592,032 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබීමෙන් රු. 17,235,598 ක් අඩුවෙන් වෙන් කිරීම් කර තිබුණි.

(3) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

2013 දෙසැම්බර් 31 දිනට අළුත්වැඩියා කුලී ගාස්තු ලෙස රු. 52,833,070 ක් අයවිය යුතුව තිබුණි. ඒ තුළ වසර 02 කට වැඩි ශේෂවල වටිනාකම රු. 28,231,328 ක්ව තිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම්.

වර්ෂ ගණනාවකට පෙර ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලබා ගෙන තිබූ රු.1,824,169 ක අත්තිකාරම පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,304,499 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 10,433,627 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,129,128 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) කාර්ය සාධනය

වාහන කුලියට සැපයීම ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ අතර, ඒවා අක්‍රීය වූ වහාම අලුත්වැඩියා කිරීමට ප්‍රමුඛතාවය ලබාදී නොතිබුණි. අංක MG 07 දරන වාහනය 2013 ඔක්තෝබර් මුලදී අක්‍රීය වී තිබුණද එය කඩිනමින් අලුත්වැඩියාව සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබීමෙන් ආයතනයට අහිමි වන ආදායම දළ වශයෙන් රු. 1,355,640 ක් පමණ විය.

(2) කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වැඩ තහනමට ලක්වූ කළමනාකරණ අධ්‍යක්ෂකරයෙකුට ගෙවා තිබූ රු. 628,700 ක සේවක ණය සමාලෝචිත වර්ෂය අවසානයටද අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ii) වර්ෂ 2009 සිට 2013 දක්වා කාලය තුළ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු රු. 5,505,492 ක් හා වර්ෂ 2012/2013 සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු. 6,168,353 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂය සඳහා ගෙවිය යුතු රු. 10,153,833 ක සේවක ආර්ථ සාධක, සේවා නියුක්ති භාර අරමුදල් සහ සේවා නියුක්ති භාර අරමුදලට ගෙවිය යුතු අධිභාර අදාල ආයතනවලට ගෙවා නොතිබුණි.

(ඈ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රු. 2,353,291 ක් වටිනා වසර 10 කට වැඩි පැරණි තොගයක් ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඉ) ආර්ථික නොවූ ගනුදෙනු

නියමිත දිනට නොගෙවීම මත සේවා නියුක්ති භාරකාර අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු. 1,384,808 ක අධිභාරයක් ගෙවා තිබුණි.

**5.1.2 මානව සම්පත් සංවර්ධන අධිකාරිය**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ගිණුම්කරණ අඩුපාඩු

ඇලවක තෘණ ව්‍යාපෘති ගොඩනැගිල්ල ඉදිකිරීමට දරා තිබූ රු. 98,970 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, ගොඩනැගිල්ල ඉදිකර තිබූ භූමියේ අයිතිය අධිකාරියට පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර ඌනතාවය රු. 5,939,372 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,938,790 ක් වූයෙන් ඌනතාවයේ රු. 2,000,582 ක වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 5,850,000 ක හා රු. 5,500,000 ක ප්‍රදාන හේතු කොටගෙන පිළිවෙලින් රු. 89,372 ක ඌනතාවයක් හා රු. 1,561,210 ක අතිරික්තයක් පෙන්නුම් කර තිබූ අතර, ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,650,582 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් සභා අරමුදල් මත ලබාදුන් ණය

පළාත් සභා අරමුදලින් ලබාදී තිබූ රු. 9,092,578 ක ණය මුදලින් පුද්ගලයින් තිදෙනෙකුගෙන් හා සමිති 20 කින් අයවිය යුතු රු. 1,845,303 ක ණය වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයවීමට තිබුණි.

(ii) ව්‍යාපෘති මත ලබාදුන් ණය

ව්‍යාපෘති ණය යටතේ ආයතන හා පුද්ගලයින් 194 දෙනෙකුට ලබාදී තිබූ රු. 33,421,500 ක ණය මුදලින් රු. 16,175,006 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවී නොතිබුණි. එය තුළ අධිකාරිය විසින් වර්ෂ 2006 - 2013 කාලසීමාව තුළදී පුද්ගලයින් 11 දෙනෙකුට ලබාදී තිබූ රු. 975,000 ක්ද ඇතුලත්ව තිබුණි.

(ඈ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු

වාර්ෂිකව සියයට 5 ක පොලී අනුපාතිකයක් යටතේ 2013 වර්ෂය තුළ අධිකාරියේ නිලධාරීන් 05 දෙනෙකු වෙත රු. 3,239,300 ක දේපල ණය අරමුණුවලින් බැහැරව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් හෝ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව චක්‍රීය අරමුදල් යටතේ නිදහස් කර තිබුණි.

**5.1.3 මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂයේ බස් රථ 322 කින් අයවිය යුතු මාසික ධාවන සටහන් හා පිවිසුම් පත් ගාස්තු රු. 1,224,000 ක් ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) රු. 105,616 ක් වටිනා තොග මුළුමනින්ම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(2) ලැබිය යුතු ගිණුම්

වසර 02 ත් වසර 13 ත් අතර කාලයක සිට ඉදිරියට එමින් පැවති ලැබිය යුතු රු. 860,501 ක ශේෂය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(3) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) වගන්තිය | මිළදී ගැනීම් හා අලුත්වැඩියා සඳහා වෙළඳපල මිළ සැදහුම් ක්‍රමය යොදා ගෙන තිබුණද, භාණ්ඩවල විස්තර, ප්‍රමාණය, ටෙන්ඩර් භාරදුන් වේලාව, ස්ථානය, වගකීම පිළිබඳ ලිඛිත සාක්ෂි පවත්වා නොගෙන, අවස්ථා 11 කදී වාහන අලුත්වැඩියාවන්ට රු. 507,497 ක් ගෙවා තිබුණි. |
| (ii) 2004 ජනවාරි 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි 2:1 ඡේදය | වයඹ පළාත තුළ නිත්‍ය බස් සේවා අවශ්‍ය වන මාර්ගයන් නිශ්චය කිරීම, විවෘත ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් මඟින් බලපත්‍රධාරීන් තෝරා ගැනීම කල යුතු වුවත්, 2013 වර්ෂයේදී එම ක්‍රියාවලියෙන් බැහැරව මාර්ග බලපත්‍ර 83 ක් සඳහා රු.1,731,000ක අවම මුදලක් අයකර බලපත්‍ර ලබාදීම සිදුකර තිබුණි. |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර රු. 10,566,847 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,004,524 ක් වූයෙන් ඌනතාවයේ රු. 2,562,323 ක වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 14,700,000 ක හා රු. 21,835,290 ක ප්‍රදාන

ගැලපීමෙන් පසු ඌනතාවයන් පිළිවෙලින් රු. 4,133,153 ක් හා රු. 13,830,766 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 9,697,613 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ජංගම මාර්ග පරීක්ෂක නිලධාරීන් 09 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 267,369 ක මුදලක් අයවීමට තිබුණි.

(ii) අධිකාරිය සඳහා ගිණුම් හා කළමනාකරණ මෘදුකාංගයක් නිර්මාණය කිරීමට 2009 දෙසැම්බර් මාසයේ පෞද්ගලික ආයතනයට රු. 100,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණද, විගණිත දින වන විටත් එහි කටයුතු අවසන් කර නොතිබීමෙන් අත්තිකාරම නිශ්කාර්ය වියදමක්ව තිබුණි.

(2) මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරියේ අරමුණට අනුකූල නොවන අවස්ථා 07 කදී රු. 161,874 ක වියදමක් දරා තිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.2. (5) වගන්තිය, 1999 ජනවාරි 09 දිනැති අංක 81 හා 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛයන්ට අනුකූල නොවන ලෙස භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවක පාරිතෝෂික ස්ථාවර තැන්පතු ඇපයට තබා රු. 8,850,000 ක ණය මුදලක් ලබා ගෙන පුද්ගලයකු නමින් පළමු ලියාපදිංචි කර තිබූ වාහනයක් රු. 8,400,000 කට මිලදී ගෙන තිබුණි.

**5.1.4** <u>ප්‍රධාන අමාත්‍ය අරමුදල</u>

මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ආදායම ඉක්ම වූ වියදම රු. 313,104 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 269,000 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 582,104 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**5.1.5** <u>පළාත් පරිසර අධිකාරිය</u>

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i). ගිණුම්කරණ අඩුපාඩු

රු. 4,203,443 ක් වටිනා වත්කම් වර්ග 04 ක් ක්ෂය කර අවසන්ව තිබුණද ඒවා ප්‍රයෝජනයට ගන්නා නිසා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ii). විගණනය සඳහා සාක්ෂි නොවීම.

විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබීමෙන් එකතුව රු. 5,297,141 ක් වූ කාර්යාල, විද්‍යා හා පරිගණක උපකරණ පිළිබඳ විස්තරාත්මකව පරීක්ෂා කළ නොහැකි විය.

(iii). නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10 වැනි වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකුහට ලබාගත හැකි උපරිම ආපදා ණය රු. 250,000 කට සීමා කර තිබියදී, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස නිලධාරීන් 06 දෙනෙකුට රු. 914,660 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර රු. 864,484 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,641,976 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,506,460 ක අඩුවීමක් දක්නට ලැබුණ අතර, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 5,350,000 ක හා රු. 5,356,230 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් අනතුරුව උක්ත අගයන් රු. 4,485,516 ක හා රු 7,998,206 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,512,690 ක අඩුවීමක් දක්නට ලැබුණි.

## 5.1.6 <u>වයඹ සංවර්ධන අධිකාරිය</u>

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ශේෂ පත්‍රයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ ගිණුම්ගත විය යුතු රු. 532,083 ක් වටිනා වත්කම් 04 ක් ධීවර ආම්පන්න ගිණුම යටතේ දක්වා තිබුණි.

(ii) පොත්වල අගය ශුන්‍ය වූ පිරිවැය රු. 8,640,520 ක ස්ථාවර වත්කම් විෂයයන් 141 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(2) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන්ගෙන් හා බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂවල වටිනාකම රු. 5,723,261 ක් වූ අතර එයින් රු. 3,072,038 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද, රු. 621,242 ක් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිටද අයවිය යුතුව තිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 5,022,526 ක් වූ අතර, එයින් රු. 1,839,964 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද, රු. 28,423 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිටද ගෙවිය යුතුව තිබුණි.

(3) විගණනය සඳහා සාක්ෂි නොවීම්

ලැබිය යුතු ආදායම් රු. 5,532,925 ක් සඳහා සනාථ කිරීම් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර ඌනතාවය රු. 8,506,577 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,971,778 ක් වූයෙන් ඌනතාවයේ රු. 1,534,799 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 7,252,000 ක හා රු. 7,416,430 ක ප්‍රදාන හේතු කොට ගෙන රු. 1,254,577 ක ඌනතාවයක් හා රු. 444,652 ක අතිරික්තයක් නිරූපණය වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,699,229 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ඉබ්බාගමුව තලගස්වැව සංචාරක මධ්‍යස්ථානයක් ඇති කිරීමට 2009 වර්ෂයේදී රු. 1,169,640 ක් වැයකර බෝට්ටු 10 ක් මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතිය අසාර්ථක වීමෙන් එම බෝට්ටු කුරුණෑගල නගර සභාවට ලබාදී තිබුණද ඒවා කිසිදු ප්‍රායෝජනයකට නොගෙන ගොඩගසා තිබුණි.

තවද 2009 දෙසැම්බර් මාසයේදී ගෘහ නිර්මාණ ශිල්පීය වියදම් රු. 238,925 ක් මෙම මධ්‍යස්ථානය වෙනුවෙන් දරා තිබුණද එයද නිෂ්කාර්ය වියදමක්ව තිබුණි.

### 5.1.7 කර්මාන්ත සේවා කාර්යාංශය

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i). ගිණුම්කරණ අඩුපාඩු

පාරිතෝෂිත ගණනය 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුකූල නොවන පරිදි සිදුකිරීම නිසා රු. 264,219 ක් වැඩියෙන් වෙන් කර තිබුණි.

(ii). පැහැදිලි නොකළ වෙනස්කම්

ලෙජර් ගිණුම් 05 ක අවසාන ශේෂයන් හා ගිණුම අනුව අවසාන ශේෂයන් අතර රු. 1,095,134 ක වෙනසක් පැවතුණි.

(iii). ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ 03 කට වැඩි එකතුව රු. 1,645,210 ක ලැබිය යුතු ශේෂයන් හා එකතුව රු. 4,075,682 ක් වූ ගෙවිය යුතු ශේෂයන් පිළිබඳ විමර්ශණයක් සිදුකර නිරවුල් කර නොතිබුණි.

(iv). විගණනය සඳහා සාක්ෂි නොවීම්.

ස්ථාවර වත්කම් රු. 65,173,261 ක් හා ඒවායේ ක්ෂය රු. 17,375,804 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණද, ස්ථාවර තැන්පතු රු. 17,688,400 ක විස්තරාත්මක උපලේඛණද, ආයෝජන රු. 2,560,000 ක විස්තරද ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිව තිබුණි.

(v). නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පළාත් මූල්‍ය රීති 420.3 ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර අවස්ථා 10 කදී රු. 1,129,477 ක් වටිනා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වියදම ඉක්ම වූ ආදායම රු. 25,653,389 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 14,370,604 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 11,282,785 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 වර්ෂයේදී එග් ඉන්කියුබේටර් 02 ක් මිලදී ගැනීමට රු. 1,480,000 ක් ගෙවා තිබුණද, එම යන්ත්‍ර දෙක මෙතෙක් සපයා නොතිබුණි. පළාත් මූල්‍ය රීති 164 (ආ) හි විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස සිදුව තිබූ මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණද, ඒ පිළිබඳ අවසන් ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

එසේම මෙම යන්ත්‍ර දෙක නොලැබීම නිසා පාදෙණිය හා කුලියාපිටියේ පිහිටුවා ඇති කුකුල් පැටවුන් අභිජනන මධ්‍යස්ථාන 02 අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

(2) මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.2 (5) වගන්තිය, 1990 ජනවාරි 09 දිනැති අංක 81 දරන අයවැය චක්‍රලේඛය හා 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛයන්ට අනුව වාහනයක් මිළදී ගැනීමට පෙර භාණ්ඩාගාර පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව 2008 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද වාහනයක් රු. 4,000,000 ක මුදලකට පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. මේ සඳහා ප්‍රසම්පාදන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ප්‍රසිද්ධ මිළ කැඳවීමක් කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලැබී නොතිබුණි. තවද මේ සඳහා ප්‍රතිපාදන සලසා ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

(ii) අවශ්‍ය පිරිවිතර සකස් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව 2013 වර්ෂයේදී රු. 545,000 ක් වටිනා පාවිච්චි කරන ලද ස්ටීම් බොයිලර් යන්ත්‍රයක් මිළදී ගැනීමට රු. 386,280 ක අත්තිකාරමක් ගෙවා තිබුණි.

**5.1.8 වයඹ ජනකලා පදනම**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) සමාලෝචිත වර්ෂයේදී පොදු ලෙජරය තුළ වූ ආරම්භක ශේෂ ඉකුත් වර්ෂයේ අදාල ගිණුම්වල අවසන් ශේෂ සමඟ සැසඳීමේදී රු. 2,212,490 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) මාස 05 කට අදාලව මුදල් පොතේ විශ්ලේෂණ තීරුවල එකතුන් හා ඊට අදාල ලෙජර් සටහන් අතර රු. 1,055,701 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) සංවත්සර ආදායම් හා ප්‍රධාන කාර්යාල ආදායම් ලෙස ලැබී තිබුණු රු. 694,534 ක ආදායම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(iv) ශේෂ පිරික්සුම තුළ ඇතුළත් ජංගම ගිණුම් 06 කට අදාල රු. 746,052 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත නොහැකි විය.

(2) විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ලෙජර් ගිණුම් 10 ක එකතුව | 1,601,778 | පොදු ලෙජරය තුළ විවෘත කළ ගිණුම් |
| (ii) | ණයහිමියෝ | 966,878 | ණයහිමි විස්තරාත්මක ලේඛණ |
| (iii) | වෙන්දේසි විකුණුම් අදායම | 106,580 | විකුණූ භාණ්ඩ විස්තර හා ලදුපත් |
| (iv) | ගැණුම් කුරුණෑගල විස්කම් නිවස | 702,362 | 2013 කෙටුම්පත් අවසාන ගිණුම හා සංශෝධිත ගිණුම අතර වූ වෙනස්කම් සඳහා බලපෑ හේතූන් |
| (v) | ගැණුම් හලාවත විස්කම් නිවස | 360,334 | |
| (vi) | ගැණුම් 50 ඩී | 415,984 | |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර අතිරික්තය රු. 8,017,584 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 662,975 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,680,559 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 900,000 ක හා රු. 1,500,000 ක ප්‍රදාන හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 8,917,584 ක් දක්වා වැඩිවී තිබුණු අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 837,025 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,080,559 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 5.1.9 පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(ආ) මූල්‍ය සමාලෝචනය

(i). මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ පළාත් සභා ප්‍රදාන ගණනය කිරීමට පෙර ඌනතාවය රු. 3,167,174 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,445,246 ක් වූයෙන් ඌනතාවයේ රු. 278,072 ක අඩුවීමක් දක්නට ලැබුන අතර, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් පළාත් සභාවෙන් ලැබී තිබූ රු. 5,650,000 ක හා රු. 5,800,000 ප්‍රදාන හේතු කොටගෙන ඌනතාවයන් පිළිවෙලින් රු. 2,482,826 ක හා රු. 2,354,754 ක අතිරික්තයන් බවට පත් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 128,072 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 5.1.10 සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමය

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සමූපකාර සංවර්ධන අරමුදලෙන් ලැබී තිබුණු රු.5,000,000 ක් සහ වයඹ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයෙන් ලැබී තිබුණු රු. 2,000,000 ක් වශයෙන් එකතුව රු.7,000,000 ක් ප්‍රාග්ධනිත නොකර වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල නොකිරීමෙන් අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයට හා මූල්‍ය තත්ත්වයට පහත බලපෑම් සිදු වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයට විගණන ගාස්තු ප්‍රතිපාදන නොකිරීමෙන් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.
- සමූපකාර සංගම් 32 කින් 2013 වර්ෂයට අදාලව 2014 වර්ෂයේදී ලැබී තිබුණු සාමාජික ගාස්තු හා දායක මුදල් රු. 2,612,485 ක් 2013 වර්ෂයේදී ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.
- ඉල්ලා අස්වූ සාමාජිකයන් 12 දෙනෙකුට ආපසු ගෙවිය යුතු දායක මුදල් රු. 285,549 ක් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වියදම ඉක්මවූ ආදායම රු.39,105,662 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.18,777,479 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.20,328,183 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

අයවැය ලේඛණමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i). වියදම් විෂයයන් 04 ක් සඳහා රු.1,400,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, තථ්‍ය වියදම රු.463,244 ක් වූයෙන් රු.936,756 ක අධි ප්‍රතිපාදන සැලසීමක් සිදුව තිබුණි.

(ii). වියදම් සඳහා එකතුව රු.1,454,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද එයින් කිසිදු වියදමක් සිදුව නොතිබුණි.

## 5.1.11 ක්‍රීඩා අරමුදල

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i). ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ ආදායම් රු. 92,950 ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ii). නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| <u>වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය</u> | |
| • ප.මූ.රී. 475 | ශිල්ප කලා ශාලිකා මධ්‍යස්ථානයේ හිටපු ස්ථානභාර නිලධාරියා විසින් වර්තමාන ස්ථානභාර නිලධාරියා වෙත ආයතනයේ නිශ්චල හා චංචල වත්කම් විධිමත්ව භාරදී නොතිබුණි. |
| • ප.මූ.රී. 476 | 2009, 2010, 2011 හා 2013 වර්ෂ සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා අරමුදලේ ආදායම ඉක්මවූ වියදම රු.18,223,535 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.15,373,470 ක් වූයෙන් ඌනතාවය රු.2,850,065 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) කාර්ය සාධනය

කුලියාපිටිය ජනාධිපති ශිල්ප කලා ශාලිකා මධ්‍යස්ථානයේ ක්‍රීඩාගාරය, බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය, ප්‍රධාන රැස්වීම් ශාලාව හා පිහිනුම් තටාකාංගනය නිසි පරිදි අලුත්වැඩියාවන් සිදු නොකිරීම නිසා කාර්යක්ෂමව එහි කටයුතු ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි.

(2) අරමුදල් ඌන උපයෝජනය

2006 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකර ගැනීමට ලැබී තිබූ රු. 1,100,000 ක මුදල ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි.

(3) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිරිවැය රු.249,165 ක් වූ සංගීත උපකරණ හා මර්කරි බල්බ 04 ක් වසර 08 ක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii) කාර්යාලයේ පරිගණකය වසර 02 ක් තිස්සේ අක්‍රීය වී තිබුණි.

(iii) 2009 වර්ෂයේදී රු.388,120 ක පිරිවැයකින් ඉදිකරන ලද නල ළිඳ ජලය නොමැති වීමෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

## 5.1.12 සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i). ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු පොලී රු. 465,662 ක මුදල මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් වී නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල රු. 639,698 ක පොලී ආදායම් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම තුළ ඇතුළත්ව තිබුණි.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් රු. 2,675,869 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,950,911 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 275,042 ක ශුද්ධ පිරිහීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) කාර්ය සාධනය

(i) 2004 අංක 03 දරන සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල් ප්‍රඥප්තියට අනුව සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග අරමුදල පිහිටුවා ඇත්තේ, වයඹ පලාත තුළ පවත්නා සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නියමානුකූලව සහ සුදුසු අවස්ථාවේදී නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීම හා බෙදා හැරීම පිණිස වුවද,

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ග්‍රාමීය මාර්ග නඩත්තු කටයුතු සිදු වී නොතිබුණි.

(ii) තෝරාගෙන තිබුණු සුළු වාරිමාර්ග ව්‍යාපාර 684 න් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර 170 ක් සඳහා පමණක් රු. 1,231,420 ක්ද ඉකුත් වර්ෂයේ ව්‍යාපාර 51 ක් සඳහා පමණක් රු. 715,402 ක්ද ගෙවීම් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 129,809 ක්ද, ආයෝජන කටයුතුවලින් රු. 3,777,479 ක්ද උපයාගෙන තිබුණු අතර, අරමුදලේ මුලු ආදායමට අරමුදලේ මෙහෙයුම් කටයුතු හා ආයෝජන කටයුතුවල දායකත්වය පිලිවෙලින් සියයට 3 ක් හා සියයට 97 ක් විය.

(iv) අරමුදලේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,231,420 ක් පමණක් වැය කර තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළ පමණක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල රු. 4,750,000 ක් විය.

(v) රාජ්‍ය සේවාවන් පවත්වා ගෙන යාම සඳහා රජය විසින් ඉහල ණය සේවා කාරක පිරිවැයක් දරමින් ණය ලබාගන්නා තත්ත්වයන් තුළ රජයේ මුදල් අඩු පොලියකට ආයෝජනය කර තිබුණි.

**5.1.13 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය.**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i). ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පසුගිය වර්ෂ 4 ක සිට අධිකාරිය දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර, සමාලෝචිත වර්ෂය ආරම්භයේදී සමුච්චිත අලාභය රු. 2,065,370 ක් වූ අතර වර්ෂයේ ශුද්ධ අලාභය රු.1,059,262 ක් වීය.

(ii). සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරිම

2013 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් ධීවර අමාත්‍යාංශයෙන් ඇණවුම් කර තිබූ වටිනාකම රු. 1,165,000 ක්වූ ෆයිබර්ග්ලාස් නිෂ්පාදනය නොකර විකුණුම් කල ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(iii). ගිණුම්කරණ ප්‍රතිපත්ති

ව්‍යාපෘති තුනකට අදාල රු. 18,284,476 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iv). ගිණුම්කරණ අඩුපාඩු

තිරසාර ජලජීවී වගා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබූ රු. 1,071,302 ක් වටිනා සෙන්ට්‍රි පියුජ් යන්ත්‍රය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(v). ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වටිනාකම රු. 4,246,023 ක්වූ ණයගැතියෝ හා වටිනාකම රු. 4,260,357 ක්වූ ණයහිමියෝ සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබුණි.

(ආ) මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ, ආදායම ඉක්මවූ වියදම රු.1,059,262 ක් වූ අතර, ඊට අනුරූපීව පෙර වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.1,155,267 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.96,005 ක වර්ධනයක් සිදුව තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

(1) කළමනාකරණ අකාර්යක්ෂමතා

අධිකාරියේ භූමි ප්‍රමාණය හා රු. 2,105,840 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ කිසිදු ගාස්තුවකින් තොරව පරිහරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණි.

(2) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) අධිකාරිය සතු මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය, මත්ස්‍ය සැකසුම් ව්‍යාපෘතිය, සින්නපාඩුව අභිජනනාගාරය, මුන්දලම නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තිබූ වටිනාකම රු. 16,077,000 ක් වූ ගොඩනැගිලි 05 ක්ද, වටිනාකම රු. 11,829,373 ක්වූ යන්ත්‍ර උපකරණ 24 ක්ද, වසර 05 ත් - 08 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ii) වටිනාකම රු.9,916,336 ක්වූ P.C.R. රසායනාගාරය වසර දෙකක් තිස්සේ කිසිදු පරීක්ෂණයක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුණි.

## 5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

### 5.2.1 වයඹ පුහුණු ආයතනය - ගිණුම් අංක 26002

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) ඍජුව බැංකුවට ලැබුණු රු. 173,907 ක චෙක්පත මුදල් පොතේ දෙවරක් සටහන් වීම නිසා පාඨමාලා ආදායම රු. 173,907 ක් වැඩිපුර දැක්වීමෙන් ලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පාඨමාලා ආදායම රු. 1,348,475 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, ලේඛණවලට අනුව 2013 වර්ෂයට අදාලව 2014 වර්ෂයේදී රු. 2,710,534 ක් ලැබී තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් රු. 1,362,059 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(2) විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 7,000,000 | (i) ස්ථාවර වත්කම් ලේඛණය<br>(ii) විස්තරාත්මක සටහන්<br>(iii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iv) අයිතිය තහවුරු කිරීමේ ලිපි |
| ගොඩනැගිලි | 92,400,000 | |
| රථවාහන | 3,800,000 | |
| ලී බඩු | 1,237,901 | |
| වෙනත් යන්ත්‍රෝපකරණ | 1,205,798 | |
| කාර්යාලීය හා පුහුණු උපකරණ | 8,414,976 | |
| උපචිත වියදම් | 733,488 | කාල විශ්ලේෂණය |
| ලැබිය යුතු ආදායම | 1,348,475 | ශේෂ සනාථ ලිපි |

(3) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | පළාත් මූල්‍ය රීති | |
| (i) | ප.මූ.රී. 375.1 | වාණිජ අත්තිකාරම් ගිණුම්වල ශුද්ධ පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන සලසා ගතයුතු වූවත්, එසේ කර නොතිබුණි. |
| (ii) | ප.මූ.රී. 546 | මුදල්, චෙක්පත්, බඩු භාණ්ඩ ආදිය භාර ගැනීම හෝ භාරව සිටින, චෙක්පත් අත්සන් කරන සහ වවුචර් සහතික කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගත යුතු වූවත්, එසේ කර නොතිබුණි. |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය ගැලපීමට පෙර ලාභය රු. 206,790 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ක්ෂය ගැලපීමට පෙර ලාභය රු. 1,175,740 ක් වූයෙන් රු. 968,950 ක ලාභයේ අඩුවීමක් දක්නට ලැබුණු අතර, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් වාර්ෂික ක්ෂය රු. 2,847,092 ක් හා රු. 2,612,736 ක් ගැලපීමෙන් පසු රු. 2,640,302 ක් හා රු. 1,436,996 ක අලාභයක් නිරූපණය කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,203,306 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

කළමනාකරණ අකාර්යක්ෂමතා

මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් රු. 114,058,675 ක් ලෙස දක්වා තිබුණද, පළාත් තක්සේරුකරු විසින් වත්කම් රු. 76,000,000 ක් බවට තක්සේරු කිරීමෙන් රුපියල් මිලියන 38 ක වත්කම් ඌන තක්සේරුවක් කර තිබුණි. ඒ අනුව තක්සේරු වාර්තාව නිෂ්කාර්ය කටයුත්තක් බවට පත්වී තිබුණි.

**5.2.2 ව්‍යවසායකත්ව සංවර්ධන සේවා ඒකාබද්ධ අභිජනන ගොවිපල මාවතගම - ගිණුම් අංක 25002**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් ගොවිපල කටයුතු වෙනුවෙන් දරන ලද එකතුව රු. 154,225 ක් වූ වියදම් විෂයයන් 04 ක් ගිණුම්ගත වී නොතිබුණි.

(ii) ගොවිපල භූමිය මැදින් ගලායන ඇල මාර්ගයෙහි පිහිටි අමුණෙන් ගොඩවී ඇති පස් ඉවත් කර දෙපස බැම් සකස් කිරීම සඳහා රු. 492,744 ක වියදම් දරා තිබුණද 2012 වර්ෂයේදී හෝ සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් එය හෙළිදරව් කර නොතිබුණි.

(2) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| (i) ප.මූ.රී.375 (1) | අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ශුද්ධ පාඩුවක් අපේක්ෂා කරන්නේ නම් එම ශුද්ධ පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) ප.මූ.රී.377(1) | ප්‍රාග්ධන වත්කම්වල අගය අඩුවීම සඳහා සමාලෝචිත වර්සයේදී රු. 604,478 ක් ක්ෂය සඳහා වෙන්කර ඇතත්, එම මුදල පොදු තැන්පත් ගිණුම ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරයට යවා නොතිබුණි. |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ පාඩුව රු. 850,506 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 68,448 ක් වූයෙන් රු. 918,954 ක පිරිහීමක් දක්නට ලැබුණි. මෙම පිරිහීම කෙරෙහි වර්ෂයේ මුළු පිරිවැටුම රු. 433,912 කින් අඩුවීම, ඍජු ද්‍රව්‍ය වියදම රු. 569,260 කින් වැඩිවීම හා වක්‍ර වියදම් රු. 69,531 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

අරමුදල් ඌන උපයෝජනය

අමාත්‍යාංශයේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ සත්ත්ව සංවර්ධන පුහුණු අභිජනන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා වෙන්කර තිබුණු රු. 535,140 ක ප්‍රතිපාදිත මුදලින් අදාල කාර්යයෙන් බැහැරව වතු කළමනාකරුගේ නිල නිවස සඳහා විදුලිය ලබා ගැනීමට හා තණකොළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීමට රු. 329,402 ක් වැය කර තිබුණි.

**5.2.3 ගොවිපල කටයුතු මෙහෙය වීම හා බිත්තර වී සැපයීම - ගිණුම් අංක 25102**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) අත්තිකාරම් ගිණුම් සීමා ඉක්මවීම

ගිණුම් කටයුත්තේ උපරිම සීමාව ඉක්මවීම රු. 1,023,963 ක් විය.

(2) ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වැය ශීර්ෂ වලින් මිලදීගත් රු. 2,344,714 ක වත්කම් විෂයයන් 7 ක් ගොවිපල වෙත පවරාගෙන තිබුණද වත්කම් පරවා ගැනීමේ ගිණුමට බැර කර නොතිබුණි.

(3) නොසැසඳු පාලන ගිණුම්

වාරියපොල ගොවිපලේ පැල තවාන ගිණුම අනුව හා තොග ලේඛණ අනුව රු. 1,093,435 ක වෙනසක් අනාවරණය විය.

(4) නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අනාවරණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| (i) ප.මූ.රී.375 (1) | මුදල් වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් කටයුත්ත මෙහෙයවීමෙන් ශුද්ධ පාඩුවක් අපේක්ෂා කරන්නේ නම් එම ශුද්ධ පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. |
| (ii) ප.මූ.රී.377(1) | ප්‍රාග්ධන වත්කම්වල අගය අඩුවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,884,490 ක් ක්ෂය සඳහා වෙන් කර ඇතත්, එම මුදල පොදු තැන්පත් ගිණුමේ ක්ෂය සංචිත අරමුදලට බැර කිරිම සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත මුදලින් යවා නොතිබුණි. |

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ පාඩුව රු. 7,282,846 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 4,618,721 ක් වූයෙන් පාඩුවෙහි රු. 2,664,125 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මෙම වැඩිවීම කෙරෙහි වර්ෂයේ පිරිවැටුම රු. 5,001,596 කින් අඩුවීම හා පරිපාලන හා පොදුකාර්ය පිරිවැය රු. 141,130 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) මෙහෙයුම් සමාලෝචනය

කළමණාකරන අකාර්යක්ෂමතා

බටු, දඹල, උඳු හා රටකජු බීජ ක්‍රි.ග්‍රෑ. 471 ක් නිෂ්පාදනය අවසන් වී මාස 4 ත් 5 ත් අතර කාලයක් ගතවී තිබුණද අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණු බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

**5.2.4 වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය - ගිණුම් අංක 25003**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(1) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) කොළඹ විශ්වවිද්‍යාලයෙන් පවරා දුන් ස්ථාවර වත්කම් සහ වට්ටෝරු භාණ්ඩ විෂයයන් 82 ක් තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ii) ශේෂ පත්‍රයේ සහ නිෂ්පාදන වෙළඳ හා ලාභාලාභ ගිණුම් දක්වා ඇති එකතුව රු. 4,502,574 ක් වූ ශේෂ විෂයයන් 7 ක් සඳහා ප්‍රධාන ලෙජරයේ ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(2) නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 177 ප්‍රකාරව අවස්ථා 12 කදී එකතුව රු. 484,585 ක් වටිනාකමැති මුදල් බැංකුගත කිරීමේදී ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය

2013 ජුලි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මෙහෙයුම් ලාභය රු. 125,757 ක් විය.

**6. මෙහෙයුම් සමාලෝචනය**

**6.1 කාර්ය සාධනය**

(අ) රජයේ ප්‍රදාන

පළාත් සංවර්ධන යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i). උපමාන පාදක ප්‍රදාන | 96,880,000 | 83,579,689 | 13,300,311 |
| (ii). පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,112,996,500 | 759,741,130 | 353,255,370 |
| (iii). සාමූහික ප්‍රදාන | 255,991,700 | 241,314,598 | 14,677,102 |
| (iv). වෙනත් ප්‍රදාන | 704,957,017 | 310,191,145 | 394,765,872 |
| | 2,170,825,217 | 1,394,826,562 | 775,998,655 |

(ආ) පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම අනුව නව වැඩ හා අවිච්ඡේද වැඩ සඳහා රු. 878,234,241 ක් වටිනා වැඩ යෝජනා 1,397 ක් අනුමත කර තිබුණි. එම වැඩ යෝජනාවල භෞතික ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|---|
| (i). | සම්පූර්ණයෙන් නිම කළ | 1,147 | 166 | 1,313 |
| (ii). | සියයට 50 කට වඩා වැඩියෙන් නිම කළ | 37 | 02 | 39 |
| (iii). | සියයට 50 කට වඩා අඩුවෙන් නිම කළ | 23 | - | 23 |
| (iv). | ආරම්භ කර නොතිබූ | 19 | 03 | 22 |
| | එකතුව | 1,226 | 171 | 1,397 |

(ඇ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වන්නිගම ඒකාබද්ධ ගොවිපල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පිහිටි භූමියෙන් අක්කර 74 ක තෘණ වගාව කල යුතු වූවද, වගා කර තිබුණේ අක්කර 05 ක පමණි. මේ නිසා ගොවිපලේ ගවයින්ට ප්‍රමාණවත් තෘණ නොමැති වීමෙන් කිරි නිෂ්පාදනය අවම මට්ටමක පැවතුණි.

(ඈ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පස් අවුරුදු සැලැස්මට අනුව 2013 වර්ෂයේදී පුහුණුව සඳහා ආධුනිකයින් 772 ක් බඳවා ගැනීමට ඉලක්ක කලද, 313 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබූ අතර, ඉන් 20 දෙනෙකු පාඨමාලාව නිමකර සහතික පත් ලබා තිබුණි. ඒ සඳහා රු. 114,416,000 ක වියදමක් දරා තිබීමෙන් ආධුනිකයකුගේ පුහුණු වියදම රු. 365,546 ක් වූ අතර, සාර්ථකව පුහුණුව නිම කළ සංඛ්‍යාව සමඟ සැසඳීමේදී එය රු. 5,720,800 ක ඉහල අගයක් ගෙන තිබුණි. ඉලක්කගත ප්‍රමාණයට ආධුනිකයින් බඳවා නොගැනීමත්, පුහුණුව විධිමත්ව සිදු නොකිරීමත්, බඳවාගත් ශිෂ්‍යයන් රඳවා ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීමත් වැනි කරුණු මත ඉලක්කගත කාර්යය සාධනයක් සඳහා ආයතනයට ලඟා වීමට නොහැකි වී තිබුණි.

(ඉ) රු. 13,300,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත තිත්තවැල්ල වැව බහුකාර්ය සුළු වාරිමාර්ග සංවර්ධන වැඩසටහන 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර එහි කාර්යයන් 10 ක් නිම කිරීම සඳහා 2012 වර්ෂය අවසාන වන විට පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය රු. 16,162,641 ක් වැය කර තිබුණද, 2013 වර්ෂයේදී වැඩසටහන අත්හැරදමා තිබුණි. සැලසුම් කළ කාර්යයන් ඵලදායී සහ කාර්යක්ෂමව ඉටුකර නොමැති බවත්, ඉලක්කගත අරමුණු ලඟා කර ගැනීමට අපොහොසත් වී ඇති බවත් අනාවරණය විය.

## 6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුතොඩෙයි ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 20.52 ක් වූ ඉඩම 1994 වර්ෂයේදී වාණිජ කටයුත්තකට සමාගමකට දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී තිබූ අතර, 2010 ඔක්තෝබර් මාසයේදී එම සමාගම ඈවර කර තිබුණි. යථෝක්ත ඉඩම ආපසු රජයට පවරා නොගෙන 2014 වර්ෂයේදී අදාල සමාගමට බදු ගෙවන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා තිබූ අතර ඒ සඳහා නෛතික පදනමක් නොවීය.

(ආ) දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබූ ඉල්ලුම් පත්‍ර 184 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රජයට අයත් ඉඩම් අක්කර 116 පර්චස් 56 ක් පුද්ගලයින් 12 දෙනෙකු විසින් 2013 වර්ෂයේ සිට අනවසරයෙන් පරිහරණය කර තිබුණි.

(ඈ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජය සතු නුරානි කර්මාන්තපුරයේ අක්කර 05 ක ඉඩමක් පෞද්ගලික යකඩ කර්මාන්ත ශාලාවකට 1999 වර්ෂයේ සිට පවරා තිබුණි. ඉඩමෙන් අක්කර 2 ½ ක් 2009 වර්ෂයේදී අංක 4/10/15695 දරන දීර්ඝ කාලීන බදුකරය යටතේ එකී සමාගමට බදුදී තිබුණද, ඉතිරි අක්කර 2 ½ ද 1999 වර්ෂයේ සිට 2009 දක්වා අනවසරයෙන් භුක්ති විඳ තිබුණි. එමෙන්ම එම කර්මාන්තපුරයේම තවත් හෙක්ටයාර 0.158 ක ඉඩමක් 1999 වර්ෂයේ සිට කාන්තාවකට බදු දී තිබුණද, අපේක්ෂිත කාර්යයට යොදා නොගත් එම ඉඩම ගිවිසුම අනුව ආපසු පවරා ගෙන නොතිබුණි.

(ඉ) මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජය සතු ඉඩම් කොටස් 12 ක් වසර 02 සිට වසර 30 දක්වා විවිධ පුද්ගලයින් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබූ අතර, ඒවා විධිමත්ව දිගුකාලීන බදුදී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) පුත්තලම අධ්‍යාපන කලාපයේ සිට වෙනත් පළාත් පාසල්වලට ස්ථාන මාරුවී ගිය ගුරුවරුන් 77 දෙනෙකු වෙනුවෙන් ලැබිය යුතු ණය රු. 1,836,913 ක් වූ අතර, එයින් වර්ෂ 01 ට වඩා වැඩි නිරවුල් නොකළ ණය රු. 1,563,684 ක් විය.

(උ) 2013 වර්ෂයේදී වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ළමා අපචාර, මූල්‍ය වංචා හා වෙනත් විනය විරෝධී ක්‍රියා වශයෙන් මුළු පැමිණිලි 262 ක් ලැබී තිබූ අතර, ඉන් කලාප අධ්‍යාපන කාර්යාල වෙත පැමිණිලි 199 ක් යොමුකර පැමිණිලි 70 ක් සඳහා පමණක් පිළිතුරු ඉදිරිපත් වී තිබුණි. පැමිණිලි 129 ක් නොවිසඳී ඉදිරියට ගෙන ගොස් තිබූ අතර, පළාත් අධ්‍යාපන කාර්යාලය විසින් පැමිණිලි 30 ක් සම්බන්ධ පරීක්ෂණ සිදුකර තිබූ අතර, එයින් පැමිණිලි 10 ක් තවදුරටත් පරීක්ෂණ මට්ටමේ පැවතුණි.

2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට පැමිණිලි 176 ක් ලැබී තිබූ අතර, එයින් 41 ක විමර්ශණ අවසන් කර නොතිබුණි.

**6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක 2012 හා 2013 වර්ෂයන්වල පළාත් ආයෝජන අරමුදල් මඟින් මිලදී ගෙන තිබූ එකතුව රු. 751,611 ක් වටිනා භාණ්ඩ වර්ග 188 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011, 2012 හා 2013 වර්ෂයන්හිදී මිලදී ගෙන තිබූ ප්ලාස්ටික් පුටු 282 ක්ද, 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වර්ග 25 ක භාණ්ඩ 194 ක්ද 2014 පෙබරවාරි වන විටත් බෙදා නොදී රඳවා ගෙන තිබුණි.

(ආ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රෝහල් 02 ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 02 ක හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් ඒකකයේ රු.3,016,124 ක් වටිනා ඖෂධ හා ශල්‍ය වෛද්‍ය උපකරණ වර්ග 162 ක ඒකක 559,177ක තොගයක්ද, වටිනාකම ගණනය කල නොහැකි වූ තවත් ඖෂධ හා ශල්‍ය වෛද්‍ය උපකරණ වර්ග 84 කින් ඒකක 874,344 ක තොගයක්ද කල් ඉකුත් වීම, නියැදි සාම්පල් අසමත් වීම, පැහැය හා සුවඳ වෙනස් වීම නිසා භාවිතයෙන් ඉවත් කර තිබුණි.

**6.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 2006 ජනවාරි 04 දිනැති අතිගරු ජනාධිපතිතුමාගේ අංක සීඑස්ඒ/පී1/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය හා එයට සංශෝධිත 2006 මාර්තු 18 දිනැති අංක. සීඑස්ඒ/පී1/40 දරන චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස 2013 වර්ෂයේදී පළාත් සභාවේ සභාපතිවරයාගේ, විපක්ෂනායකවරයාගේ, සමාජ සුභසාධන පළාත් අමාත්‍යවරයාගේ සහ එම අයගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට රු. 281,800 ක් සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

ඉහත චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට හා ආණ්ඩු පක්ෂ සංවිධායකවරයාට දුරකථන දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස 2013 වර්ෂයේ මාස 09 ක් සඳහා රු. 870,291 ක් ගෙවා තිබුණි.

(ආ) 2013 සැප්තැම්බර් 26 දිනැති පාර්ලිමේන්තු මහ ලේකම්ගේ ලිපියට අනුකූල නොවන ලෙස පළාත් සභාවේ සභාපතිවරයාට, විපක්ෂ නායකවරයාට, පළාත් අමාත්‍යවරුන් 04 දෙනෙකුට හා පළාත් සභා මන්ත්‍රීවරුන් 46 දෙනෙකුට 2013 වර්ෂයේදී දුරකථන දීමනා ලෙස රු. 4,870,671 ක් ගෙවා තිබුණි.

(ඇ) සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ මැහුම් උපදේශිකාවන් 36 දෙනෙකු සිටියදී විධිමත් අනුමැතියකින් තොරව මැහුම් පාඨමාලාවන් සඳහා පැයකට රු. 500 බැගින් සම්පත් දායකයින් 04 දෙනෙකු අවස්ථා 11 කදී යොදවා දීමනා ලෙස රු. 192,000 ක් හා සංග්‍රහ දීමනා රු. 15,765 ක් ගෙවා තිබුණි.

## 6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2013 මුල් මාස 04 ට අදාල ගමන් වියදම් ප්‍රතිපූර්ණ වවුචර් 10 ක සඳහන් කර ඇති වටිනාකමට වැඩි වටිනාකමක් දක්වා රු.174,091 ක් වංචනිකව ලබාගෙන තිබුණි.

## 6.7 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

| ආයතනයේ නම | වත්කම් ගණන | වටිනාකම | අක්‍රීයව තබා ඇති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| කුරුණෑගල ආයුර්වේද රෝහල | පංචකර්ම කටු චිකිත්සක හා යෝග මධ්‍යස්ථානය | 3,859,706 | 2012 සිට |
| අඹන්පොල රෝහල | පංචකර්ම ඇඳන් | - | 2011 සිට |
| කුලියාපිටිය මූලික රෝහල | ශල්‍යාගාර 4 ක් සහිත ගොඩනැගිල්ල | 411,000,000 | 2012 සිට |
| කුලියාපිටිය මූලික රෝහල | මහල් 4 ඖෂධ ගබඩාව | - | 2010 සිට |
| පොල්පිතිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | භාණ්ඩ ඒකක 68 | - | වර්ෂ 06 සිට 20 |
| පොල්පිතිගම දිසා රෝහල | ප්‍රාථමික ප්‍රතිකාර ඒකකය | 1,059,620 | 2012 සිට |
| පොල්පිතිගම දිසා රෝහල | වාට්ටු හා සායන වලින් ඉවත් කල භාණ්ඩ වර්ග 270 | - | වසර 2 - 15 |
| පොල්පිතිගම දිසා රෝහල | දෙමහල් ළමා වාට්ටු ගොඩනැගිල්ල | 6,612,023 | 2009 සිට |
| මාරවිල මූලික රෝහල | ශල්‍යාගාර ලාම්පුව | 1,300,000 | 2011 සිට |
| අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | රජයේ ඉඩමක ගොඩනැගිලි 02 ක් | - | 1996 සිට |
| පුත්තලම මූලික රෝහල | ස්පේක්ට්‍රොපොටෝ මීටර් 01 | 630,000 | 2012 සිට |
| | වෛද්‍ය උපකරණ 07 | - | 2011 සිට |

## 6.8 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් දෙකක රජය සතු ඉඩම් කට්ටි 101 ක් අනවසරයෙන් පරිහරණය කරමින් තිබුණි. එමෙන්ම තවත් ග්‍රාම නිලධාරී වසම් දෙකක පුද්ගලයින් 600 ක් පමණ වසර 05 කට වැඩි කාලයක සිට රජයේ ඉඩම් අනවසරයෙන් පරිහරණය කරමින් තිබුණි.

(ආ) හලාවත පළාත් විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් අධීක්ෂණය කරන ලද, හලාවත බසාර් වීදිය කාපට් යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයට රු. 407,592 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 6.9 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ රු. 10,446,172 ක වියදමින් කුලියාපිටිය රුඳවුම් ළමා නිවාසයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර භාවිතා කිරීම සම්බන්ධයෙන් සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i). ගොඩනැගිල්ලේ ඇළුමිනියම් ජනෙල්, යකඩ ග්‍රිල් සවිකිරීම හා ගෙබිම සිමෙන්ති දමා සුද මැදීම වෙනුවෙන් ඇස්තමේන්තු පිරිවැයට වඩා රු. 63,610 ක් වැඩිපුර වියදම් දරා තිබුණි.

(ii). අනුමත ඇස්තමේන්තුව අනුව වර්ණ ජල බේසම් 05 ක් සවිකළ යුතු වුවද, වර්ණ රහිත ඒවා සවිකර තිබූ අතර ඒවාටද වර්ණ ජල බේසම්වල මිළ ගණන් ගෙවා තිබුණි.

(iii). ඉහල මාලයේ ප්‍රධාන ශාලාවේ සිමෙන්ති දමා සුද මැද තිබූ වර්ග මීටර 70.98 ක ප්‍රදේශය ඉරිතලා වලවල් හැරීම නිසා රු. 23,423 ක අලාභයක් සිදුව තිබුණි.

(iv). ද්විත්ව පලු සහිත දොරවල් 04 ක් සවිකර තිබූ අතර, ඉන් එක් දොරක් ස්ථිරවම වසා දමා තිබීම හේතුවෙන් රු. 30,504 ක නිෂ්ඵල වියදමක් දැරීමට සිදුව තිබුණි.

(v). ගොඩනැගිල්ලේ බිම් හා ඉහල මහල්වල ඇතුලත හා පිටත බිත්ති ස්ථාන 09 කින් ඉරිතලා තිබූ අතර, අප ජලය බිත්ති දිගේ කාන්දු වීමෙන් බිත්ති විනාශ වීමට ලක්වීමත් වැසි දිනවලට ගොඩනැගිල්ලේ වහලයෙන් ජලය ගලා ඒමත් සිදුව තිබුණි.

(vi). ජල සැපයුම් ටැංකිවලට ලඟා වීමට (යාමට) මාර්ගයක් සකසා නොතිබුණි.

(vii). පහත හා ඉහල මහල්වල වැසිකිලි හා නාන කාමරවල අප ජලය බැස යන මාර්ග අවහිර වී තිබීම නිසා නේවාසිකයින් අපහසුතාවයන්ට පත්ව තිබුණි.

(ආ) ඉංජිනේරු දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ කුරුණෑගල ආයුර්වේද රෝහලේ බාහිර රෝගී අංශයේ පෝටිකෝව අළුත්වැඩියා කිරීමේදී ඇස්තමේන්තුවේ දැක්වෙන රු. 480,137 ක් වටිනා වැඩ විෂයයන් 09 ක් හා රු. 732,409 ක් වටිනා වැඩ විෂයයන් 20 ක් අත්හැර ඒ වෙනුවට රු. 337,384 ක් වටිනා වැඩ විෂයයන් 16 ක් වැඩියෙන් ඉටුකර තිබුණද, පරිපාලන නිලධාරී කාමරයේ, වෛද්‍යවරුන්ගේ විවේකාගාරයේ, වාට්ටු ලිපිකරුගේ කාමරයේ හා ප්‍රධාන හෙද නිලධාරිණියගේ කාමරයේ ටයිල් පුපුරා පොලොව බොල් වී තිබූ බව භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) ඉංජිනේරු දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ කුරුණෑගල ශුද්ධ වූ පවුලේ බාලිකා විද්‍යාලයේ 60' x 43' තෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර II රු. 4,622,564 ක මුදලකට ඉටුකිරීමට ගිවිස ගෙන තිබුණද, ඒ සඳහා රු. 440,725 ක් වැඩිපුර ගෙවා තිබුණි. එහි පංති කාමරයක ජනෙල් දෙකක් වැසීමට නොහැකි අතර, පංති කාමර කිහිපයක බිත්තිවල පිපුරුම් සිදුව තිබුණි.

(ඈ) කුරුණෑගල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය වෙත රු. 1,267,833 ක් වෙන් කර දී තිබූ ව්‍යාපෘති 11 කින් රු. 545,279 ක් වටිනා කර්මාන්ත 03 ක් 2013 වර්ෂය අවසානයටද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) නිතෝගම වැව ප්‍රතිසංස්කරණය කිරීමට රු. 245,233 ක්ද, හංවත්ත අමුණ ඉදිකිරීමට රු. 196,189 ක්ද, ලෙස රු. 441,422 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඉංජිනේරු දෙපාර්තමේන්තුව එම කර්මාන්ත ඉටුකිරීම අත්හැර දමා තිබුණි.

## 6.10 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 2011 වසර සඳහා "ත්‍රි භාෂා ශ්‍රී ලංකා වැඩසටහන" ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් රු. 1,000,000 ක් ප්‍රධාන ලේකම් වෙත ලබාදී තිබුණද 2014 මාර්තු 28 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ ඇස්තමේන්තු 07 ක් මගින් රු. 58,495,655 ක් වැය කර ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් "වයඹ ගොවිගෙදර" ඉදිකිරීම් කර තිබුණද, මෙම ගොඩනැගිල්ල මෙතෙක් ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඇ) වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ 2008 වර්ෂයේදී ආරම්භ කර තිබූ කුරුණෑගල මලියදේව ආදර්ශ මහා විද්‍යාලයේ 90 x 25 දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම අවසන් කිරීමට පෙර තවත් ගොඩනැගිල්ලක් සඳහා ප්‍රතිපාදන වෙන්ව තිබුණද ගොඩනැගිලි 02 හිම ඉදිකිරීම් 2013 වර්ෂය වන විටත් අවසන් කර නොතිබුණි.

**6.11 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද රෝහල් 08 ක් සහ මධ්‍යම බෙහෙත් ශාලා 22 ක් පිහිටි ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි.

**6.12 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත්/ බාහිර පුද්ගලයන්ට අයත් සම්පත්**

2005 අගෝස්තු 27 දින මාස්පොත ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබූ ගනේගොඩ ප්‍රාථමික විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කඩදාසි ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තයක් සඳහා ලබාදී තිබුණද, එම දේපළ අදාල ආයතනය වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි.

**6.13 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කලාප කාර්යාල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,441 | 1285 | 156 | - |
| තෘතීය මට්ටම | 539 | 395 | 144 | - |
| ද්විතියික මට්ටම | 9,542 | 7,819 | 1,723 | - |
| ප්‍රාථමික මට්ටම | 4,427 | 3,894 | 533 | - |
| එකතුව | 15,949 | 13,393 | 2,556 | - |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය (කලාප කාර්යාල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පති | 1,461 | 1,220 | 241 | - |
| ගුරුභවතුන් | 23,292 | 23,720 | - | 428 |
| සුළු සේවක | 1,908 | 1,805 | 103 | - |
| වෙනත් | 614 | 635 | - | 21 |
| අනියම්, තාවකාලික | - | - | - | - |
| එකතුව | 27,275 | 27,380 | 344 | 449 |

(ඈ) අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පෞද්ගලික ලේකම් | 06 | 06 | - | - |
| සම්බන්ධීකරණ ලේකම් | 08 | 07 | 01 | - |
| මාධ්‍ය ලේකම් | 06 | 04 | 02 | - |
| මහජන සම්බන්ධතා නිලධාරි | 06 | 06 | - | - |
| පෞද්ගලික සහකාර | 06 | 06 | - | - |
| කළමනාකරණ සහකාර | 18 | 13 | 05 | - |
| කාර්යාල කාර්ය සහයක | 08 | 09 | - | 01 |
| වෙනත් (රියදුරු) | 24 | 205 | - | 181 |
| එකතුව | 82 | 256 | 08 | 182 |

(ඇ) පළාත් පාලන කාර්ය මණ්ඩලය (පළාත් සභා)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 22 | 06 | - |
| තෘතීය මට්ටම | 48 | 22 | 26 | - |
| ද්විතියික මට්ටම | 970 | 689 | 281 | - |
| ප්‍රාථමික මට්ටම | 2,489 | 2,860 | - | 371 |
| එකතුව | 3,535 | 3,593 | 313 | 371 |

### 6.13.1 පළාත් සභා අධ්‍යාපන හා සෞඛ්‍ය හැර අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලය පිළිබඳ නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) නාගරික ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් අනුයුක්ත කළ යුතු වුවත්, වයඹ පළාතේ නගර සභා තුනෙහිම කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන් එකී තනතුරුවල වැඩ ආවරණය කිරීමට පත්කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ලේකම් තනතුර සඳහා කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන් සිටිය යුතු වුවත්, පළාත තුළ පිහිටි ප්‍රාදේශීය සභා 15 ක පළාත් පාලන නිලධාරීන් 09 දෙනෙකු, වැඩසටහන් සහකාර දෙදෙනෙකු හා කළමනාකරණ සහකාර I හා II පන්තිවල නිලධාරීන් 04 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත යොදවා තිබුණි.

(ඇ) පළාත් සභා බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතන 33 ක තනතුරු 317 කින් 152 ක් සඳහා සුදුසුකම්ලත් අය පත් නොකිරීම නිසා එම තනතුරු ඇති කිරීමෙන් පළාත් පාලන ආයතන

අපේක්ෂා කළ මහජන සේවාවන් සතුටුදායක ලෙස ඉටුවේ යැයි අපේක්ෂා කළ නොහැකිව තිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවට හා පළාත් පාලන ආයතනවලට උපාධිධාරී අභ්‍යාසලාභීන් 803 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. ඒ අනුව අදාල ආයතනවලට අනුමත සංඛ්‍යාව හා යොදවා ඇති සංඛ්‍යාව සැසඳීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 08 දෙනෙකුගේ අතිරික්තයක්ද හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ 09 දෙනෙකුගේ අතිරික්තයක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ 32 ක පුරප්පාඩුද පැවතුණි. එමෙන්ම පළාත් පාලන ආයතන සහිත කොට්ඨාශ යටතේ අනුමත ප්‍රමාණය සමඟ සැසඳීමේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ අතිරික්තතා 02 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පුරප්පාඩු 132 ක්ද විය.

(ඉ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය අනුව 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු 104 ක් පැවතුණි.

**6.13.2 අධ්‍යාපනය සම්බන්ධව ගුරු අතිරික්තය හා ඌනතාවය, අනුයුක්ත කිරීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පුත්තලම අධ්‍යාපන කලාපයේ පාසල් 192 න් පාසල් 88 ක විදුහල්පති තනතුරු සඳහා වැඩබලන විදුහල්පතිවරුන් පත්කර තිබූ අතර, ගුරු පුරප්පාඩු 1076 ක් පැවතුණි.

(ආ) පුත්තලම අධ්‍යාපන කලාපයේ සිංහල හා දෙමළ පාසල්වල 2013 වර්ෂය තුළ අනුප්‍රාප්තිකයින් රහිතව සිදුකරන ලද ගුරු මාරුවීම් හේතුවෙන් පුරප්පාඩු 307 ක් ඇති වී තිබුණි.

(ඇ) හලාවත අධ්‍යාපන කලාපයේ ජාතික පාසලක් ඇතුළු පාසල් 08 ක විදුහල්පති ශ්‍රේණිධාරීන් 12 දෙනෙකු ගුරු සේවයේ රාජකාරි සඳහා යොදවා සිටි අතර ආරච්චිකට්ටුව, හලාවත, නාත්තන්ඩිය, වෙන්නප්පුව කොට්ඨාශවල පාසල් 37 ක ගුරුවරුන් 37 දෙනෙකු 2013 වසර තුළදී විදුහල්පති තනතුරුවල වැඩ බැලීමට පත්කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 344 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, තනතුරු දෙකකට බඳවා ගෙන තිබුණු නිලධාරීන් 449 ක අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමටද ආයතනය කටයුතු කර නොතිබුණි.

**6.13.3 සෞඛ්‍ය අංශය සම්බන්ධව එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පුරප්පාඩු තනතුරු 1,753 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු තනතුරු 158 ක් පිරවීමට අපොහොසත් ව තිබුණි.

(ඇ) ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා සඳහා ඖෂධ සංයෝජක තනතුරු 45 ක් අනුමත වී තිබුණද එම තනතුරු සියල්ලම පුරප්පාඩු වී පැවතුණි. ඒ සඳහා වෙනත් තනතුරුවල සේවකයින් යොදවා තිබුණි.

(ඈ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බඳවාගෙන තිබුණු 278 ක අතිරික්ත සේවකයින් පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 ඔක්තෝබර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තනතුරු 33 කට අදාලව නිලධාරීන් හා සේවකයන් එකතුව 1,343 දෙනෙකු පිළිවෙලින් අවුරුදු 05 ත් අවුරුදු 10 ත් අතර කාලයක් හා අවුරුදු 10 ට වැඩි සේවා කාලයක් සේවයේ යෙදී තිබුණි.

(ඊ) 2013 වර්ෂයේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්ය මණ්ඩල වාර්තාවලට අනුව මාරවිල හා පුත්තලම මූලික රෝහල්වල පිළිවෙලින් වෛද්‍ය නිලධාරීන් 22 දෙනෙකුගේ අතිරික්තයක් හා 16 දෙදෙනෙකුගේ පුරප්පාඩුවක් පැවතුණි. අතිරික්ත කාර්යය මණ්ඩලය වෙනුවෙන් අතිකාල හා අනෙකුත් දීමනා අඛණ්ඩව ගෙවා තිබුණි.

**6.14 බැංකු සැසඳුම්**

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් 18 කින් 15 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කර මාස 06 ඉක්ම ගිය චෙක්පත්වල වටිනාකම රු.1,915,164 ක් වූ අතර, පළාත් මූල්‍ය රීති 283 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් 08 කට රු. 235,483 ක හඳුනා නොගත් හර හා බැංකු ගිණුම් 06 ක රු. 916,153 ක හඳුනා නොගත් බැර කිරීම් පැවති අතර, ඒවා හඳුනා ගෙන අදාල කටයුතු කර නොතිබුණි.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**7.1 ක්‍රියාකාරී සැලැස්ම**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන ප්‍රවාහන, විදුලිබල නිවාස හා ඉදිකිරීම් පිළිබඳ අමාත්‍යාංශය, ආණ්ඩුකාරවර කාර්යාලය හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**7.2 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ එක් එක් ආයතනවල අභ්‍යන්තර විගණන ඒකකයක් බැගින් ස්ථාපිත කර නොතිබුණි.

**7.3 විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ආයතන විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, වයඹ ජනකලා පදනම, සමූපකාර සංවර්ධන පදනම, කර්මාන්ත සේවා කාර්යාංශය, කෘෂිකර්ම, ධීවර සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, සුළු වාරිමාර්ග සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ආණ්ඩුකාරවර කාර්යාලය.

**08. පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුව තිබුණි.

(අ) ගිණුම්කරණය හා ආදායම් රැස්කිරීම
(ආ) වත්කම් හා මානව සම්පත් කළමනාකරණය
(ඇ) කොන්ත්‍රාත් ඉටුකිරීම් හා ගෙවීම්
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ) ප්‍රඥප්ති මත පිහිට වූ ආයතනවල මූල්‍ය කටයුතු හා මෙහෙයුම් පාලනය
(ඊ) වාහන භාවිතය